


# රහතුන්ගේ සාර බුලත් විට

පෙබරවාරි සන්නසට මා ලියූ ලිපිය කියවා රහතුන්ගේ කරච්චලය ඇහිච්ච කෙනෙක් ශ්‍රී ලංකාවේද ඇත. මා නමින් පමණක් දන්නා ඔහු ප්‍රකට චිත්‍ර ශිල්පියකු වන බන්ධුල හරිශ්චන්ද්‍ර ය. ඔහු ලියා ඇත්තේ මට පිළිතුරු වශයෙන් යයි කියන ලිපියකි. ලක්බිම පත්තරයටය.

එබන්දකු මාර්ග ඵල ගැන උනන්දුවීම හෝ අධ්‍යාපනයක් ලැබීම හෝ මට පුදුමයට කරුණක් නොවේ. චිත්‍රයක් ඇඳීම වාගේම චිත්‍රයක රස විඳීමද එක්තරා ආකාරයක භාවනාවකි. ඒ වාගේ උදවිය නිවන් මගේ සැළකිය යුතු දුරක් ගෙවා සිටින්නටද ඉඩ ඇත .

හරිශ්චන්ද්‍ර මට දෙන පිළිතුරක් නැත . පිළිතුරක් දීමට ප්‍රශ්නයක් මා නැගුවේද නැත . ඒ නිසා ඔහු තමන්ගේ ගුරුතුමා කියනා කතන්දරයම යළි යළිත් පුනරුච්චාරණය කරයි.

හිටපු ජනාධිපති ජේ ආර් ජයවර්ධන සහ හිටපු අධ්‍යාපන ඇමතිවරයකු වූ අයි එම් ආර් ඒ ඊරියගොල්ල යන දෙදෙනාම මේ අත් බවේදීම නිවන් යා හැකි බව කීවෝය. ඒ නිසා ඔය තරම් පොතපතෙන් නිදසුන් උපුටා දැක්වීම අවශ්‍ය නැත . මම ඒ අදහසට විරුද්ධ නොවන්නෙමි. වෙනසකට ඇත්තේ මම රහතෙකැයි අඬ බෙර ගැසූ පලියට එය පිළිගැනීමට මම නොකැමැත්තෙමි.

හිතවත් ලේඛකය.. ඔබ සඳහන් කරන රහත් නමකගේ පිටට පාරක් ගැසීමෙන් කතාව මට සිහිපත් කරවන්නේ අභාවප්‍රාප්ත සායි බාබා සිය දහම පතුරුවන ගැනට ඊමට පෙර සිදුවීමකි. ඔහු ගුරුවරයකු සොයා ගෙන යද්දී එක්තරා සාන්තුවරයකු හමුවූ බැවින් ඒ පුද්ගලයාගේ සාන්තුවර ගුණය පිරික්සනු වස් ප්‍රශ්නයක් ඇසුවේය. ඒ ප්‍රශ්නය ඇසූ සාන්තුවරයා පිළිතුරු දෙනු වෙනුවට තරුණ සායි බාබාට බැණ වදින්නට විය. මේ මනුස-සයාගෙන් මට ගත හැකි පලක් නැතැයි තීරණය කළ තරුණ තවුසා අන් අතක් බලා ගියේය.

ඔබ කළ යුතුව තිබුණේ මට පිළිතුරු දීමට මහන්සි වෙනවා වෙනුවට මා දැක්වූ අදහස් හා යෝජනා ගැන ඔබේ ගුරු රහතුන් වහන්සේට දැදුම් දීමය. මා සඳහන් කළේ රහත් ඵල ලද්දකු නම් වත්මන් ශ්‍රී ලංකා සංඝ සමාජයේ දක්නට ඇති කුණු කන්දල් නොහොත් බෙංගමුවේ නාලක හිමි කියා ඇති ආකාරයේ "කඳ පණුවන්" ඉවත් කිරීමේ කාරියට අත ගහන එක හොඳ බවය.

ඒ වාගේ වැඩකට අත ගහපු ඇමති කෙනෙක් පසුගිය දා මහා පූජාවක් රැගෙන මහනුවර මහා නායක හාමුදුරුවන් හමුවීමට ගියහ. උන්වහන්සේට සුදුසු නව පන්නයේ බුලත් විටක් ඒදා ගෙනය ඒ ගමන ගියේ.

අපි ඉස්සර

තාම්බූලං පතිගන්නාමු
චූන්ණ පූග සමායුතං..

යනුවෙන් කියා වැන්දෙමු. දැන් ඒක වෙනස් කළ යුතුය. චූන්ණ වෙනුවට කරදමුංගු හෝ වසාවාසි යෙදිය යුතුය.

සමහර විට ඔබට මතක ඇති අනගාරික ධර්මපාල තුමා අපේ භික්ෂූන් වහන්සේට බැණ වැදුණ ආකාරය. නිකම් පන්සල් වලට වෙලා පඩික්කම් පුරවනවා යයි කී මේ කතාව කාටත් රිදෙනා විදියටය. දැන් වත් ගරු ඇමතිවරයකුට ඒ වදන් සිහිපත් වී නව නිෂ්පාදනයක් වෙළඳ පොළට හඳුන්වාදීම අගය කළ යුතුය. වැඩි දොහක් යන්නට මත්තෙන් සාරවිට නිෂ්පාදනයත් ජාතික කර්මාන්තයක් බවට පත්වනු සිතුරුය.

මගේ ලිපියේ චූන්ණ ගුණ ගැන කියා නැත . මට ලැබුණ අලුත් තොරතුරු වලට අනුව මතු වූ අදහ-සකි. මා කීවේ පල්ලි වලට මුස්ලිම් පල්ලිවලට කඩා වදිමින් බුදු බණට නොගැලපෙන ක්‍රියා කරන භික්ෂූන් යහ මග යැවීම ට රහත්වූවන් සිතුවොත් හොඳ බවය.

මා කියන දේ ඔබට වැටහේ නම් එයට ඔබේ නව අදහස්ද එක් කොට ඔබේ රහතුන් වහන්සේලාට ආරාධනා කරන්න. අර තව්තිසා දෙව් ලොව සිටින මහ බෝසතුන්ට ආරාධනා කළා වාගේම.

"කාලෝ අයංතෙ මහාවීර"

වචන වෙනස් කළ යුතු බව නොකිව මනාය.

කලින් ලිපියේ ස=හන් කළ පරිදි මම බෞද්ධ පඬිවරයෙක් නොවෙමි. ඒ වුණාට එක එක පිඬිවරුන් කියනා පලියට බුදු බණ කියා ඉදිරිපත් කරන මනස්ගාත පිළිගැනීමට සිතන්නෙක්ද නො-වෙමි.

මම ශ්‍රී ලංකාවේ වැඩිහිටි ප්‍රකට භික්ෂූන් වහන්සේ කීප දෙනකුම ළඟින් ඇසුරු කොට ඇත්තෙමි. ඒ එක් හිමි නමක් හෝ තමන්ගේ ශීලය පෙන්වන්නට නොගියහ. ඒ කාගෙ කාගේත් දුබලතා මම දැන සිටියෙමි. මා ගරු කළේ උන්වහන්සේගේ අවංක කමටය. නිහතමානයටය. මට කිසි පුද්ගලයකු හරි ගස්සන්නට අයිතියක් හෝ උවමනාවක් නැත . කිසිවකු වෙනුවෙන් අවි අමෝරා ගෙන ඉදිරියට යාමටද මම නොකැමැත්තෙමි. මා විශ්වාස කරන දහමට අනුව තමාගේම ආත්ම ශක්තිය මත විශ්-වාසය තබා ක්‍රියා කිරීමට බෞද්ධයා පමණක් නොව කවර පුද්ගලයකු වුවද පුරුදු විය යුතුය. සමත් විය යුතුය.



ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises
**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au